# සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

(මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ)

## පුරප්පාඩු

1980 අංක 46 දරන පාර්ලිමේන්තු පනත මගින් පිහිටුවන ලද සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය විශ්‍රාමිකයින් සඳහා සමාජ ආරක්ෂණය සපයනු ලබයි. එය රටේ දෙවන විශාලතම විශ්‍රාමික අරමුදල වන අතර අරමුදල් පදනම රු.බිලියන 485 ඉක්මවා යන අතර දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 19 ක් පිහිටා ඇත. වර්තමානයේදී අරමුදලට දායකත්වය දක්වන සාමාජිකත්වය දළ වශයෙන් මිලියන 2.6 ක් වන අතර සේවකයන් 56,000 ක් ආවරණය කරයි.

**පහත දක්වා ඇති පුරප්පාඩු පිරවීම පිණිස සුදුසුකම් ලත් වෘත්තිකයන් බඳවා ගැනීමට මණ්ඩලය අපේක්ෂා කරයි.**

1.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන හා මානව සම්පත්)** (HM 1-3)<br><br>**(පුරප්පාඩු 1)** | විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් මානව සම්පත් කළමනාකරණය / වාණිජවේදී සමාජ විද්‍යාව// විද්‍යාවේදී (විද්‍යා ධාරාව)/ කලා/ නීති/ විද්‍යාවේදී (රාජ්‍ය පරිපාලනය/ව්‍යාපාර පරිපාලනය) පිළිබඳ මූලික උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ පිළිගත් අදාළ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වයක් සමඟ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 18 ක පළපුරුද්ද සහිත වීම. එම වසර 18 න් වසර තුනක් සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සේවය කර තිබිය යුතු ය. |

2.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|
| **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණය)** (HM 1-3)<br><br>**(පුරප්පාඩු 1)** | විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මගින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් පරිගණක විද්‍යා/තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ පිළිගත් අදාළ වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වයක් සමඟ කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 18 ක පළපුරුද්ද සහිත වීම. එම වසර 18 න් වසර 03ක් සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සේවය කර තිබිය යුතු ය. |
| අපේක්ෂකයාට, මෘදුකාංග නිර්මාණය, මෘදුකාංග සැලසුම්, ජාල සහ ක්‍රියාත්මක කිරීම, JAVA 8, Spring Boot, Micro services, Spring data, Hibernate, Log 4j, Aspectj, Rancher OS, Red Hat, IBM OS 400, Angular 7, MySQL 8 සහ IBM DB2 පිළිබඳ හොඳ දැනුම සමඟ යහපත් තොරතුරු තාක්ෂණ පසුබිමක් තිබිය යුතු ය.<br><br>(Cloud Computing, දත්ත ආරක්ෂාව සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.) | |

**වැටුප් පරිමාණය** - (HM 1-3) රු. 86,865/- 15 x 2,270/- රු. 120,915/- ( ආරම්භක වැටුප් පියවර - රු. 86,865/-)

**වයස** - අවුරුදු 35ට නොඅඩු අවුරුදු 56ට නොවැඩි අය විය යුතුය

**ඉහත තනතුරු සඳහා ඇති වෙනත් ප්‍රතිලාභ**

- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛනවලට අනුව වියදුරෙකු සහ ඉන්ධන දීමනා සහිත වාහනයක් හෝ සම්බන්ධිත වාහනය භාවිතා කිරීමේ දී වාහන දීමනාව සහ තනතුරට අදාළ ඉන්ධන දීමනාව ලබා දෙනු ඇත.
- ණය පහසුකම්
- භාණ්ඩාගාර අනුමැතියට යටත්ව වාර්ෂික ප්‍රසාද දීමනා
- වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ ක්‍රමය
- මාසික දිරි දීමනා

3.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|
| **කළමනාකරු (නීති) (MM 1-3) කලාප III ජීවනය - මාතර කාර්යාලය (පුරප්පාඩු 1)** | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීති උපාධියක් තිබීම. දැනටමත් නීතිඥයෙකු ලෙස සහතික කිරීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. පළමු උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (1) පළපුරුද්දක් ලබා තිබීම. |

4.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද |
|---|---|
| **කළමනාකරු - මූල්‍ය (ප්‍රකාශන සහ එකතු කිරීම්) (MM 1-3)**<br><br>**(පුරප්පාඩු 1)** | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් වාණිජ/කළමනාකරණය හෝ මූල්‍ය උපාධියක් සහ උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (1) පළපුරුද්දක් ලබා තිබීම.<br><br>හෝ<br><br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ, කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ (CIMA)-UK, සහතිකලත් පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක, වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) අන්තර්මධ්‍ය විභාගය සමත්ව තිබීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් (1) වසරක පළපුරුද්ද. |

**වැටුප් පරිමාණය** - (MM 1-3) රු. 55,925/- 10 X 1,375/- - 15 X 1,910/- රු. 98,325/-
(ආරම්භක වැටුප් පියවර රු. 55,925/-)

**වයස** - අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45ට නොවැඩි අය විය යුතුය

**ඉහත තනතුරු සඳහා ඇති වෙනත් ප්‍රතිලාභ**

- ණය පහසුකම්
- භාණ්ඩාගාර අනුමැතියට යටත්ව වාර්ෂික ප්‍රසාද දීමනා
- වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණ ක්‍රමය
- මාසික දිරි දීමනා

**තෝරීම් ක්‍රමවේදය - ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය**

තෝරාගත් අයදුම්කරුවන්ට රටේ අනුමත ජීවන වියදම් දීමනාව සහ සමාන තත්ත්වයේ රාජ්‍ය සංවිධාන විසින් ලබාදී ඇති විවිධ අනෙකුත් ප්‍රතිලාභ හිමි වේ.

කෙටි හා දත්ත විස්තර පත්‍රිකාවක් සහ සහතික පිටපත් සමඟ දෝෂ නොවන දෙදෙනෙකුගේ සම්බන්ධතා විස්තර සහිත අයදුම්පත්‍ර, ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ ලියුම් කවරයක බහා 2023.12.04 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත්, තනතුරට තෝරා ගතහොත් නිදහස් කරන බව දක්වමින් අදාළ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු ය.

සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
තැ.පෙ. 807, "මෙහෙවර පියස"
නාරාහේන්පිට, කොළඹ 05